**කැළණිය ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

කැළණිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කැළණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දින වන විට සාවද්‍ය ලෙස ගිණුම් ගතකර තිබුණු ක්ෂය වටිනාකම රු.4,388,438 ක් නිවැරදි කිරීම සඳහා සමුච්චිත අරමුදල බැර කළයුතු වුවත්, ක්ෂය වෙන් කිරීම් ගිණුම බැර කර තිබුණි. | පිළිගතිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය වටිනාකම රු.1,737,921 ක්ද, පූර්ව වර්ෂවලට අදාල ක්ෂය වටිනාකම රු.2,131,720 ක්ද අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2. නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 7 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව එකතු වටිනාකම රු.219,222,838 ක් හා උපයෝගී ලේඛනවල එකතු වටිනාකම රු.153,152,579ක් වූයෙන් රු.66,070,249 ක වෙනසක් විය. | වෙනස සම්බන්ධයෙන් පරීක්ෂා කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 7 කට අදාලව හිඟ ආදායම් වාර්තාව අනුව එකතු වටිනාකම රු.69,442,254 ක් හා හිඟ ආදායම් කාල විශ්ලේෂණ වාර්තාව අනුව එකතු වටිනාකම රු.67,683,174 ක් වූයෙන් රු.1,759,080 ක වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.3. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උත්සව ශාලා කුලී ලේඛණයක් පවත්වාගෙන නොයන නිසා රු.733,489 ක කුලී ආදායමක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නැවත බදු දීමේදී කුලී ලේඛනයක් පවත්වාගෙන යන බව. | ලේඛනය සකස් කළ යුතුය. |

## 1.7. අනුකූල නොවීම්

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන ආඥා පනතේ 20 වගන්තිය | 2009 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අයකර තිබුණි. | තක්සේරු කටයුතු නැවත ආරම්භ කර ඇති බව. | නව වරිපනම් බදු රේටයන් ලබා ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(ආ) | 1997 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුල ලබාදෙන ලද අත්තිකාරම් වටිනාකම රු.4,529,977 ක් 2023 අප්‍රේල් 30 දින වන විටත් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | රු.4,529,977 ක් 2023 අප්‍රේල් 30 දින වන විට අයකර ගැනීමට පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් පියවා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.111,371,688 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.25,202,130 ක් විය.

### 2.2 . ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 71,000,000 | 62,635,232 | 14,462,268 | 48,998,852 | 74,000,000 | 64,748,504 | 65,464,445 | 44,933,514 |
| (ii) | කුලී | 28,175,400 | 31,913,924 | 30,789,868 | 22,830,680 | 22,878,949 | 26,328,512 | 24,014,130 | 22,267,194 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,700,000 | 3,426,652 | 3,426,652 | - | 1,700,000 | 899,394 | 899,394 | - |
| (iv) | වෙනත් ආදායම් | 8,750,000 | 13,448,854 | 13,448,854 | 733,489 | 2,400,100 | 364,068 | 364,068 | 733,489 |
| | | 113,625,400 | 111,424,662 | 62,127,642 | 72,563,021 | 100,979,049 | 92,340,478 | 90,742,037 | 67,934,197 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟහිටි වරිපනම් හා බදු රු.48,998,852 ක ශේෂය තුල වසර 10 ට වැඩි ශේෂය රු.11,788,626 ක් විය. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | පනතට අනුව හිඟ වරිපනම් ශේෂ අයකර ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ වරිපනම් වටිනාකම රු.42,319,901 කින් 2023 මැයි 10 දින වන විට අයකරගෙන තිබුණු වටිනාකම රු.16,749,161 ක් විය. | 2023 වර්ෂයේදී හිඟයෙන් රු.7,198,254 ක් අය කර ගෙන ඇති බව. | -එම- |
| (ආ) | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට වෙළඳ ස්ථාන 73 කින් වසරක් ඉක්මවා ගෙවීම් පැහැර ඇති ශේෂය රු.9,492,140ක් විය. | තොරණ හන්දිය කඩ කාමර විරෝධතා පරීක්ෂණය අනුව අය කිරීම් සිදු කරන බව. | හිඟ වෙළඳ ස්ථාන කුලී අයකර ගත යුතුය. |
| (ii) | කඩ කුලී උපලේඛනය අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වනවිට හිඟ කඩ කුලී වටිනාකම රු.4,072,409 ක් වී තිබු කඩ කාමර 27 ක වර්ෂය තුල කිසිදු මුදලක් අයවී නොතිබුණි. | විරෝධතා පරීක්ෂණය අනුව අය කිරීම් සිදු කරන බව. | -එම- |
| (iii) | සිනමා ශාලා දෙකක 2020 ජනවාරි මාසයේ සිට හිඟ කුලී වටිනාකම රු.425,145 ක් 2023 අප්‍රේල් 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මුද්‍රා තැබීමට කටයුතු කරන බව. | හිඟ සිනමා ශාලා කුලී අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **පාරිසරික ගැටළු** | | |
| | කැලණිය ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන ආදාහනාගාර 4 ක් සඳහා 2023 අප්‍රේල් 30 දින වන විටත් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ලියකියවිලි සම්පූර්ණ වූ විගස බලපත්‍රය ලබා ගැනීමට මධ්‍යම පරිසර අධිකාරියට යවන බව. | පරිසර බලපත්‍ර ලබාගත යුතුයි. |

(ආ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී සභාව විසින් දිරන කසළ ටොන් 4,255 ක් හා නොදිරන කසළ ටොන් 3,805 ක් බැහැර කිරීමට රු.74,003,563 ක වියදමක් දරා තිබුණි. | කොම්පෝස්ට් අංගනය පුළුල් කිරීමට ඉඩ නොමැති බව. | ඵලදායී කසළ කළමණාකරන සැළැස්මක් සකස් කර ගත යුතුය. |

**3.2. වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වත්කම්වල ආරක්ෂාව තහවුරු නොවීම | | |
| | තක්සේරු වටිනාකම රු.6,550,000 ක් වූ ඉඩම් 5 ක බිම් ප්‍රමාණය හඳුනාගෙන නොතිබුණි. | ඉඩම් පිළිබඳ විමර්ශණ කටයුතු සිදු කරමින් පවතින බව. | බිම් ප්‍රමාණය හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | පොදු නාන ළිං සහිත ඉඩම් 2 ක අනවසර ඉදිකිරීම් සිදුකර තිබුණි. | නිර්දේශ ක්‍රියාත්මක කිරීමව යොමු කරන බව. | අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතුය. |
| (ඇ) | සභාව යටතේ ක්‍රියාත්මක වන පුස්තකාල 9 ක 2022 දෙසැම්බර් 31 දිනට රු.1,009,154 ක් වටිනා පොත් 4,861 ක් අස්ථානගත වී තිබුණි. | ඌණතා අය කර ගැනීමට යොමු කර ඇති බව. | ඌණතා අය කර ගත යුතුය. |
| (ඈ) | සංචාරක අමාත්‍යාංශයෙන් 2008 ජූලි 03 දින සභාවට ලැබී තිබුණු රු.1,195,000 ක් වටිනා ට්‍රැක්ටරය පවරාගැනීමට අවශ්‍ය ලියවිලි 2019 වර්ෂයේදී භාරදී ඇතත්, පවරා දී නොතිබුණි. | ලේඛන නැවත ඉදිරිපත් කර පවරා ගැනීමට කටයුතු කරන බව. | පවරා ගත යුතුය. |

**3.3. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක ණය** | | |
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සේවය තහනම් කළ, සේවය අතහැර ගිය, මියගිය හා විශ්‍රාම ගිය පිළිවෙලින් නිලධාරීන් 4 දෙනෙකුගේ රු.487,312 ක්ද, නිලධාරීන් 4 දෙනෙකුගේ රු.382,972 ක්ද, එක් නිලධාරියෙකුගේ රු.163,820 ක්ද, නිලධාරීන් 6 දෙනෙකුගේ රු.988,980 ක්ද ලෙස නිලධාරීන් 15 දෙනෙකුගේ එකතු වටිනාකම රු.2,023,084 ක් සේවක ණය අයවීම් හිඟ හිටව පැවතුණි. | ඇපකරු විශ්‍රාම සහ එතෙර ගොස් තිබීම, මරණ සහ විශ්‍රාම පාරිතෝෂිතයන් ලැබී නොතිබීම වැනි හේතු නිසා අයවී නොමැති බව. | සේවක ණය අයකර ගත යුතුය. |